Youth, Peace & Security

# *Youth, Peace and Security in Sri Lanka*

## *2017*



# තාරුණ්‍ය, සාමය සහ ආරක්ෂාව – ශ්‍රී ලංකාව

**සාමාජික සංවිධාන:**

World Vision Lanka
Search for Common Ground
Helvetas
United Nations Population Fund (UNFPA)
United Nations Volunteers (UNV)
Open House International
Sri Lanka Unites
International Youth Alliance for Peace
Food and Agriculture Organization of the United Nations (FAO)
Hashtag Generation
Rotaract
United Nations Children's Fund (UNICEF)
WUSC Sri Lanka

# තාරුණ්‍යය, සාමය හා ආරක්ෂාව වාර්තා කෂේඩායම

**ප්‍රධාන කතුවරුන්**:
Karim Farishta – Search for Common Ground
Leyla Radjai – United Nations Volunteers

**සංස්කාරක / දායකවරුන්** :
Ramzi Deen – Open House International
Thevuni Kotigala – Open House International
Premjit Williams – World Vision Lanka
Lalindra Ranasinghe – World Vision Lanka
Ka Yan Leung – United Nations Population Fund
Bridgette Kennedy – United Nations Population Fund
Takashi Kogoma – United Nations Volunteers
Romeral Ortiz Quintilla – United Nations Volunteers

**පරිවතකයින් සහ සොදුපත්බලන්නන්:**
Renuka Ranganathan – Online UN Volunteer
Patalee Weerasinghe – V-Force Volunteer
Anjali Nawarathne – V-Force Volunteer
Gajithira Puvanendran – Young Peacebuilder
Remo Shihan – CREATE initiative

**විශේෂ ස්තුතිය**:
Mr. Lakshitha Saji Prelis – Search for Common Ground

# ශ්‍රී **ලංකාවේ** තාරුණ්‍යය, **සාමය සහ ආරක්ෂාව**

<u>හරය</u>

2017 අප්‍රේල් සිට ජූලි දක්වා කාලසීමාව තුල ශ්‍රී ලංකාවේ පළාත් හතරක- බස්නාහිර, නැගෙනහිර, උතුර, දකුණ නාමික වශයෙන් ගත් කල කොළඹ, මඩකලපුව, කිලිනොච්චිය සහ මාතර දිස්ත්‍රික්ක වල තෝරාගත් තරුණ නියැදි කිහිපයකට සිදුකල සමූපදේශනයන්හි අරමුණු කිහිපයකි. ඒවා නම්, 1. තාරුණ්‍යයේ සාමය සහ ආරක්ෂාව යන්නෙහි අර්ථය වටහා දීම. 2. සාමය ඇතිකිරීමේ කර්තව්‍යයෙහිදි ඇතිවන බාධක සහ අභියෝග හඳුනා ගැනීම, සහ 3. සාමය පිහිටුවීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමේදී සමාජමය, ජාතික සහ අන්තර්ජාතික අදියර මිමි නිර්දේශ කිරීම. සමූපදේශනයන් සඳහා සහභාගී වූ තරුණ තරුණියන්ගේ අදහස් මෙම වාර්තාවේ දැක්වේ.



# පටුන


1. හැඳින්වීම ..... Error! Bookmark not defined.

ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ලේඛනය .....**Error! Bookmark not defined.**

ශ්‍රී ලංකාවේ ගැටුම්කාරී තත්වයන් .....**Error! Bookmark not defined.**

යෞවනය, සාමය හා ආරක්ෂාව පිලිබඳ අධ්‍යනය ..... 8

2. සාමය හා ආරක්ෂාව යන්න පිලිබඳ තාරුණ්‍යයේ අදහස..Error! Bookmark not defined.

යුධ, ගැටුම් හා අරගල වල නොපැවැත්ම ..... 11

එකමුතුව..... 12

සාධාරණය ..... 13

නිදහස ..... 13

3. ලංකාවේ සාමයට හා ආරක්ෂාව කෙරෙහි බලපා ඇති අභියෝග හා අවහිරතා ..... 14

භාෂා බාධකයන් ..... **Error! Bookmark not defined.**

සමාජ සම්මත හා තහංචි..... **Error! Bookmark not defined.**

අන්තවාදී පණිවිඩ ..... **Error! Bookmark not defined.**

කුඩා යෞවන කණ්ඩායම් සඳහා ප්‍රවේශය අඩු වීම ..... **Error! Bookmark not defined.**

ප්‍රධාන නගරය සහ ඉන් පිටත කණ්ඩායම් වල ප්‍රවේශය**Error! Bookmark not defined.**

4. ශ්‍රී ලංකාවේ සාමය හා ආරක්ෂාව සඳහා පැවතිය යුතු ප්‍රමුඛතා හා නිර්දේශ..... Error! Bookmark not defined.

ප්‍රජාව:..... **Error! Bookmark not defined.**

අන්තර් සංස්කෘතික හුවමාරු හා පුහුණු වැඩසටහන්... **Error! Bookmark not defined.**

අනුකම්පාව සහ දයානුකම්පාව ..... **Error! Bookmark not defined.**

සම පදස්ථයන් අතර බෙදීම් හරහා සංවාදය ..... **Error! Bookmark not defined.**

අන්තර්පරම්පරා අතර විශ්වාසය ගොඩනැගීම**Error! Bookmark not defined.**

ජාතික:..... **Error! Bookmark not defined.**

අතුරුදන් වූ පවුල්වල තරුණයින් සඳහා වන්දි.... **Error! Bookmark not defined.**

තීරණ ගැනීම කෙරෙහි ප්‍රවේශ වීම හා දැනුවත් වීම ..... **Error! Bookmark not defined.**

රැකියා ආශ්‍රිත හා අන්තර් සම්බන්ධිත දක්ෂතා ගොඩ නැගීම.....**Error! Bookmark not defined.**

සාර්ථක දේශීය ව්‍යාපෘති ආරම්භ කිරීම ..... **Error! Bookmark not defined.**

අන්තර්ජාතික: ..... **Error! Bookmark not defined.**

තරුණ කණ්ඩායම් සහ නහවුරු කිරීමේ දත්තවලට පිවිසීම **Error! Bookmark not defined.**

ජාත්‍යන්තර සාමය ගොඩනගන පිරිස් සහ ආගමික පූජකවරු සමග වැඩ කිරීම ..... **Error! Bookmark not defined.**

බාධක හරහා සන්නිවේදනය කිරීම සහ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය සහතික කිරීම..... **Error! Bookmark not defined.**

## 1. <u>හැඳින්වීම</u>

| **ශ්‍රී ලංකාව**[1] | |
|---|---|
| ජනගහනය | 22,409,381 (2017 est.) |
| ජනවාර්ගික කණ්ඩායම් | සිංහල: 74.9%<br>ශ්‍රී ලාංකේය දෙමල: 11.2%<br>ශ්‍රී ලාංකේය යෝනක: 9.2%<br>ඉන්දීය දෙමල l: 4.2%<br>වෙනත්: 0.5% (2012 est.) |
| භාෂා | සිංහල ( ප්‍රධාන භාෂාව ): 74%<br>දෙමල ( ප්‍රධාන භාෂාව ): 18%<br>ඉංග්‍රීසි ( සබැඳි භාෂාව ): 10%<br>වෙනත්: 8% |
| ආගම් | බෞද්ධ: (Official): 70.2%<br>ඉස්ලාම්: 12.6% |

[1]CIA the World Factbook (https://www.cia.gov/library/publications/the-world-factbook/geos/ce.html)

| | |
|---|---|
| | මුස්ලිම්: 9.7%<br>රෝමානු කතෝලික: 6.1%<br>වෙනත් - ක්‍රිස්තියානි: 1.3%<br>වෙනත්: 0.05% (2012 est.) |
| වයස් පන්ති | අවුරුදු 0-14 : 24.06%<br>අවුරුදු 15-24 : 14.63%<br>අවුරුදු 25-54 : 41.58%<br>අවුරුදු 55-64 : 10.06%<br>අවුරුදු 65 සහ 65 ට වැඩි : 9.67% (2017 est.) |

තාරුණ්‍යයේ සහභාගීත්වයෙන් තොර සංවර්ධනයක් හෝ සාමය ගොඩනැගීමක් නොමැත. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 2250 වන අනුවර්තනය යටතේ සාමය පිහිටුවීමේ ක්‍රියාවලියේදී තාරුණ්‍යයේ සහභාගිත්වයේ වැදගත්කම සඳහා වැඩි අවධානයක් සහ වටිනාකමක් ලබාදී ඇත. ශ්‍රී ලංකාව තුල අවුරුදු 26 ක් තිස්සේ පැවති අරගලකාරී වාතාවරණය 2009 දී අවසන් වූ දින සිට ශ්‍රී ලංකාව සාමය සහ සහජීවනය පවත්වාගැනීම සඳහා කටයුතු කරමින් පවතියි. ශ්‍රී ලංකාවේ ජනගහන සමානුපාතයෙන් විශාල කොටසක් තාරුණ්‍ය නිසාවෙන්, සාමය පවත්වාගැනීම සඳහා වැඩි දායකත්වයක් තාරුණ්‍යයෙන් ලැබිය යුතු බව පැහැදිලිය. මෙම වාර්තාව සාමය ගොඩනැගීමේදී තාරුණ්‍යය මුහුණ දෙන ගැටළු සලකාබැලීම සහ සාමය පිහිටුවීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමේදී සමාජමය, ජාතික සහ අන්තර්ජාතික වශයෙන් මිනුම් දඬු නිදේශ කිරීම අරමුණු කරගනියි.

## <u>ශ්‍රී **ලංකාවේ ජන** සංඛ්‍යා **ලේඛනය**</u>

ලංකාව විවිධ ජනවාර්ගික කොට්ඨාස වලින් යුත් රටකි. වගුවට අනුව, ආසන්න වශයෙන්, රටේ මුළු ජනගහනයෙන් 75% ක් සිංහල බෞද්ධ වේ. 15% ක් පමණ ද්‍රවිඩ ජනතාවය. ඉන් වැඩි ප්‍රමාණයක් හින්දු ආගමිකයන්ය. මුළු ජනගහනයෙන් 9% ක් ශ්‍රී ලාංකේය යෝනක වන, ඉන් වැඩි කොටසක් ඉස්ලාම් ආගමිකයන්ය.
ශ්‍රී ලංකාවේ භාවිතා වන ප්‍රධාන භාෂා 2 කි. ඒවා නම් සිංහල සහ දෙමළ භාෂා වේ. රටේ ජනගහනයෙන් 74% ක් පමණ සිංහල භාෂාව භාවිත කරන අතර, 18% ක පමණ ප්‍රමාණයක් දෙමළ භාෂාව භාවිත කරයි. ඉංග්‍රීසි සබැඳුම් භාෂාවක් ලෙස සැලකේ. නමුත්, එහි ප්‍රවීන 10% ක් පමණ ය.

අතීතයේදී 'සිලෝන්' නම් වූ මෙම රට, 1948 දී දල වශයෙන් අවුරුදු 500 කට පමණ පසුව පෘතුගීසි, ලන්දේසි, සහ යටත් විජිත තත්වයෙන් මිදුණි. 'ශ්‍රී ලංකාව' ලෙස

මෙහි නම වෙනස් කෙරුණේ 1972 දීය. නිදහසෙන් පසු ලංකාව කැරළිකාර අවස්ථාවන් දෙකකට භාජනය විය. එනම් 1977 සහ 1987/ 89 කාලසීමාවේදීය. තවද, 1980 මුල් භාගයේ සිට 2009 දක්වා කාලයේදී ව්‍යසනකාර සිවිල් ගැටුමක් ඇතිවිය. යටත් විජිතයක්ව පැවතී සමයේ සහ නිදහස ලබාගැනීමෙන් පසු, පැවතුනු ජාති භේද මූලික කරගත් දේශපාලනමය සහ ආර්ථිකමය රාමුව, රටේ වර්තමාන ජනවාර්ගික ගැටුම් සඳහා මූලික හේතුව ලෙස සලකයි.

නිදහසෙන් පසු ලංකාවේ ජාතික භාෂාව වටා ගැටළු ගොඩනැගුනු අතර, රාජ්‍ය සේවය තුලද වෙනස් වීම් ඇති විය. මෙය ජාතිවාදයට මූලාරම්භ වූ අතර රටේ දේශපාලන පද්ධතිය තුල දේශාභිමානය උලුප්පා විදහා දැක්වීමක් සිදු කරන ලදී.

නිදහසෙන් පසු, ඉංග්‍රීසි පාලනය යටත් විජිත සමයේ ද්‍රවිඩ ජනතාව ප්‍රතිලාභ ලැබුවේ යයි විශ්වාස කල සිංහල ජනතාව, ඔවුන් නොසලකා හරිමින් නීති සම්පාදනය කරන ලදී. 1956 දී සිංහල භාෂාව ජාතික භාෂාව කරමින් බිහිවූ 'සිංහල පමණි පනත' මෙම කරුණ තවදුරටත් තහවුරු කරයි. මෙම නිසා බොහෝ ද්‍රවිඩ ජනතාවට තම සිංහල භාෂා නොහැකියාව නිසා තම රාජකාරී පවා අතහැර යාමට සිදුවිය. මෙම තත්වය යටතේ ද්‍රවිඩ තරුණයින්ට සීමා සහිත අධ්‍යාපන සහ රැකියා අවස්ථා හිමිවිය.

මෙම ජනවාර්ගික බෙදුම්කාරී රාජ්‍ය ප්‍රතිපත්ති සහ භාවිතයන්, ශ්‍රී ලංකාවේ මූලික අයිතීන් අහිමි වූ සුළුතර ජන කොටසක් බිහි කිරීමට හේතුවූ අතර, එය ගැටුම්කාරී තත්වයකට මුලපිරීය. වසර ගණනාවක් මුළුල්ලේම ප්‍රතිපත්ති සමාලෝචනය කර ඇති නමුත්, මෙම ගැටළු ප්‍රමාණවත් ලෙස විසඳා ගැනීමට එය හේතු වී නැත. සුළුතර ජනයාට තමා හුදෙකලා වීම හා කොන් වීම යන හැඟීම් දිගටම පැවතියේය. අවසානයේදී එල්.ටී.ටී.ඊ. සංවිධානය (දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය) පිහිටුවීම මගින් දිවයිනේ උතුරේ සහ නැගෙනහිර දෙමල ජනයා සඳහා ස්වාධීන රාජ්‍යයක් සඳහා සටනක් බිහිවිය. 1983 දී රජයට එරෙහි කැරලිකරුවන්ගේ නැගීමත් සමග ආරම්භ වූ ගැටුම, ශ්‍රී ලංකා හමුදාව 2009 දී එල්ටීටීඊය පරාජය කිරීමත් සමග අවසන් විය.

කෙසේ වෙතත්, එල්ටීටීඊය ළමා සොල්දාදුවන් පෙරමුණට යැවූ අතර, තරුණයෝ සටනට දැඩි ලෙස සම්බන්ධ කරගන්නා ලදි. තව ද, යෞවනයන් බලහත්කාරයෙන් හෝ ස්වේච්ඡාවෙන් බඳවා ගන්නා ලද අතර, උතුරු පළාතේ තරුණයින් 2009 වසරේ යුද්ධය අවසන් වීමෙන් පසුව ද, තවදුරටත් සමාජයෙන් කොන් විය.

එල්ටීටීඊ සහ ශ්‍රී ලංකා රජය අතර ගැටුමේ කාල වකවානුවට සමගාමීව, ජ.වි.පෙ. (ජනතා විමුක්ති පෙරමුනේ) කැරැල්ල ලෙස හඳුන්වන සිංහල තරුණයන් සහ රජය අතර ගැටුමක් ඇති වීම තවත් වැදගත් සිදුවීමක් විය. ග්‍රාමීය ප්‍රජාව නොසලකා හරිමින් නිර්මාණය වූ ඇතැම් ප්‍රතිපත්තිවලට විරුද්ධව විශ්ව විද්‍යාල හා පාසල්වල තරුණයින් විප්ලවවාදී විය. මෙම තත්වය පාලනය කිරීම සඳහා සුදුසු දේශපාලන විසඳුමක් වෙනුවට යුද බලය යොදා ගැනීමේ ප්‍රතිපල වශයෙන්, මෙම තත්ත්වය වර්තමානයේ ද, තාරුණ්‍යයේ හැකියාවන් හා අස්ථාවරභාවයන් පිළිබඳ නිෂේධාත්මක හැඟීමක් සමාජය තුල පැවතීමට හේතු විය .

යුද්ධය වසර 26 ක් තිස්සේ පැවතුන අතර එයට වියදම් වූ ජාතික ධනය පමණක් නොව, ප්‍රධාන වශයෙන් එමගින් සමාජයට සිදුවූ බලපෑම, මහජන මතය සහ යෞවනයන්ගේ මානසිකත්වය හා ආකල්ප වලට සිදුවූ බලපෑම අදටත් බලපවත්වෙයි.

කෙසේවෙතත්, යෞවන යෞවනියන්ට සිදුවන බලපෑම ඔවුන්ගේ වයස සහ ප්‍රාදේශීය සහ භූගෝලීය පසුබිම මත එකිනෙකාගෙන් වෙනස් විය හැක. උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ගැටුම් සංකේන්ද්‍රගත වූ නිසා උතුරේ සහ නැගෙනහිර පළාත්වල තරුණයන්ට ගැටුමෙන් සෘජුව බලපෑම් වී ඇති අතර, බටහිර හා දකුණු පළාත්වල තරුණයෝ ගැටුමේ පෘජු අත්දැකීම් ලබා නොමැති විය හැකි වුවද, වෙනත් ආකාර වලින් එහි අත්දැකීම් ලබා තිබෙනවා විය හැක. පවුලේ සාමාජිකයන් මරණයන් හා පවුල් සාමාජිකයින්ගේ යුධ සහභාගීත්වය තරුණ පරපුරේ යුද්ධය පිලිබඳ ආකල්ප සහ හැඟීම් හැඩගස්වීමට හේතුවී ඇත. තව ද, ගැටුම 2009 දී අවසන් වීමත් සමග, පශ්චාත් යුධ සමයේ සමහර තරුණයින්ට යුධ වාතාවරණයේ මතකයන් නොමැති විය ද හැකිය.

## යෞවනය, සාමය හා ආරක්ෂාව පිළිබඳ ප්‍රගති අධ්‍යනය

2016 අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන ආයතන, තරුණ කටයුතු අරමුණු කරගත් සංවිධාන, ආධාරකරුවන් සහ රාජ්‍ය පාර්ශ්වකරුවන් එකතු කර ගනිමින් පොදු න්‍යාය පත්‍රයක් යටතේ UNSCR 2250 යෝජනාව සමාජගත කිරීම හා ප්‍රචලිත කිරීම සඳහා ව්‍යාපාරයක් දියත් කරන ප්‍රථම රටවල් අතර විය. මෙම ක්‍රියාවලියෙහි එක් පියවරක් වූයේ, මෙම න්‍යාය පත්‍රය රාජ්‍ය ජාතික භාෂා 2 (සිංහල සහ දෙමළ) යන දෙකට පරිවර්තනය කිරීමයි. ඊට පසු එක්සත් ජාතීන්ගේ 2250 පළමුවන සංවත්සරය සැමරීමට අනුගාමීව සමාජ මාධ්‍ය හරහා

තරුණයාට ඔබින පරිදි න්‍යාය පත්‍රයේ සාරාංශයන් කාටූන මගින් ප්‍රචලිත කරන ලදී.

ඉන් පසුව, යෞවන, සාමය සහ ආරක්ෂාව (YPS) පිළිබඳ ප්‍රගති අධ්‍යනය සඳහා දායක වීම සඳහා තරුණ සමූපදේශන මාලාවක් සංවිධානය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන සහ සිවිල් සංවිධාන (CSOs) සමන්විත ජාලයක් පිහිටුවා ඇත. YPS ජාලය එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන ගණනාවකින් සමන්විත වේ. එනම්, UNICEF, UNFP, FAO, UNICEF, CSOs සහ සමාජ සංවර්ධන සංවිධානයන්, World Vision වැනි පොදු සංවිධාන, එක්වෙමු ලංකා, හෑෂ්ටැග් පරම්පරාව, සාමය සඳහා ජාත්‍යන්තර යෞවන සාම සන්ධානය, ඕපන් හවුස් ඉන්ටර්නැෂනල්, හෙලේවිටාස් සහ WUSC ශ්‍රී ලංකා. මූලික සාකච්ඡා World Vision මගින් සිදු කරන ලද අතර පොදු සෙවීම් සහ හෙල්විටස් විසින් උපදේශන ක්‍රියාවලියක් සඳහා ජාලයක් පිහිටුවීමට කටයුතු කරන ලදී. ජාලයේ සංවිධානවල නියෝජිතයින් උපදේශන ක්‍රියාවලිය සැලසුම් කිරීම හා හඳුනාගත් දිස්ත්‍රික්ක 4 ක උපදේශන වැඩසටහන් පැවැත්වීම සඳහා රැස්වීම් හා වැඩමුළු කිහිපයක් පවත්වන ලදී. ප්‍රගති අධ්‍යයන වාර්තාව සංවර්ධනය කරන ලද්දේ පොදු සෙවුම සහ UNV ඉහත සඳහන් කළ ජාලයන් සමඟ සාකච්ඡා කිරීමෙනි.

බටහිර, නැගෙනහිර, උතුරු සහ දකුණ, පළාත් වල කොළඹ, මඩකලපුව, කිලිනොච්චිය සහ මාතර යන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක හතරක දී 2017 අප්‍රේල් සිට ජූලි දක්වා උපදේශන කටයුතු සිදු විය. සාමය හා ආරක්ෂාව සම්බන්ධ ගැටළු සාකච්ඡා කිරීමට තරුණයන්ට පහසු සහ ආරක්ෂිත පරිසරයක් ලබා දීම සඳහා විවිධ දිස්ත්‍රික්කවල තරුණ තරුණියන් අතර භාෂා බාධක පැවතීම සහ විවිධාකාර දෘෂ්ටිකෝණයන් සහ ජීවනෝපාය අත්දැකීම් ආදිය සලකා බලමින්, YPS ජාලය විසින් එක් ජාතික සමූපදේශනයක් වෙනුවට පළාත් වශයෙන් සමූපදේශනයන් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. එක් එක් ආයතනවල සීමිත අරමුදල් හා සම්පත් හේතුවෙන් සමූපදේශන කටයුතු සිදු කරනු ලැබුවේ සිව් වතාවක් පමණි. මෙම අධ්‍යයනය සඳහා තෝරාගත් නියැදිය සමස්ත ශ්‍රී ලාංකේය තරුණ පරම්පරාවම නියෝජනය නොවිය හැකි වුවත්, මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැගීම සඳහා වූ තරුණ පරපුරේ වර්තමාන තත්ත්වය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට වැදගත් වේ.

මෙම සමූපදේශනයන් සඳහා යෞවනයන්ව සම්බන්ධ කරගන්නා ලද්දේ ඉහත සඳහන් YPS ජාලයේ සංවිධාන හරහාය. මීට අමතරව වයස අවුරුදු 18 ත් 28 ත්

අතර වයස් කාණ්ඩවල සහභාගී වූවන් අතර ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම සමඟර සංයුතියක් පවත්වා ගැනීම සඳහා උත්සාහයක් ගනු ලැබීය.

ශ්‍රී ලංකාවේ උපදේශනය පිළිබඳ විස්තර පහත දැක්වේ:

| **කොළඹ** | |
|---|---|
| සංවිධායකයින් | Search for Common Ground, UNFPA, World Vision, Sri Lanka Unites, UNV |
| දිනය | අප්‍රේල් 19-20, 2017 |
| සහභාගී වූවන් සංඛ්‍යාව | 24 |
| පහසුකම් සපයන්නන් සංඛ්‍යාව | 4 |
| භාෂා | ඉංග්‍රීසි |

| **මඩකලපුව** | |
|---|---|
| සංවිධායකයින් | International Youth Alliance for Peace, World Vision Lanka |
| දිනය | මැයි 27-28, 2017 |
| සහභාගී වූවන් සංඛ්‍යාව | 28 |
| පහසුකම් සපයන්නන් සංඛ්‍යාව | 4 |
| භාෂා | දෙමළ |

| **කිලිනොච්චි** | |
|---|---|
| සංවිධායකයින් | Helvetas, Sri Lanka Unites |
| දිනය | අප්‍රේල් 24, 2017 |
| සහභාගී වූවන් සංඛ්‍යාව | 21 |
| පහසුකම් සපයන්නන් සංඛ්‍යාව | 4 |
| භාෂා | දෙමල |

| **මාතර** | |
|---|---|
| සංවිධායකයින් | Open House International, Search for Common Ground, UNV, FAO |
| දිනය | ජූලි 8-9, 2017 |
| සහභාගී වූවන් සංඛ්‍යාව | 15 |
| පහසුකම් සපයන්නන් සංඛ්‍යාව | 3 |
| භාෂා | සිංහල |

## 1 ශ්‍රී ලංකාවේ තරුණයන්ට සාමය සහ ආරක්ෂාව යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

සමූපදේශනයෙදී සාමය හා ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න වන 'සාමය හා ආරක්ෂාව යන්නෙන් ඔබට අදහස් වන්නේ කුමක්ද?' සහ 'ඔබට වඩාත්ම වැදගත් සාමය හා ආරක්ෂාව පිළිබඳ ගැටළු මොනවාද?' යනාදිය සහභාගී වූ තරුණයින්ගෙන් ප්‍රශ්න කරන ලදී. 'සාමය සහ ආරක්ෂාව' පිළිබඳ සංකල්පය ඉතා පුළුල් වන අතර එය පුද්ගලයාගේ ජීවිතයේ විවිධ පැතිකඩයන් සම්බන්ධව, ඔවුන්ගේ පසුබිම, ඔවුන්ගේ මූලාරම්භය, වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය සහ ආගම ආදිය මත පදනම් විය හැකිය.

ශ්‍රී ලංකාවේ යෞවන යෞවනියන්ට සාමය සහ සුරක්ෂිතභාවය පිළිබඳ සංකල්පයට අදාළව ප්‍රධාන තේමාවන් හතරක් හඳුනාගෙන ඇති බව ඔවුන්ගේ ප්‍රතිචාරයන් විශ්ලේෂණය කිරීමෙන් පසු පෙනී ගියේය. 'ප්‍රචණ්ඩත්වය, යුද්ධය සහ ගැටුම් නොමැති වීම', 'එක්සත්කම', 'යුක්තිය' සහ 'නිදහස' ලෙස ඒවා හඳුනාගත හැකිය.

<u>ප්‍රචණ්ඩත්වය, යුද්ධය සහ ගැටුම් නොමැති වීම</u>

*"ප්‍රචණ්ඩත්වය, යුද්ධ හා ගැටුම් නොමැති පරිසරයක සාමය බලපැවැත්වේ."*

*"සාමය යනු ජාතිය, භාෂාව සහ ආගම පදනම් කරගත් ගැටුම් / බෙදීම් නොනිබීමයි. එක් එක් පුද්ගලයා ඔවුන්ගේ මනය හා ක්‍රියාමාර්ගය සමානාන්මිකව ප්‍රකාශ කිරීමට ඇති හැකියාව හා අයිතිය භුක්ති විඳිනු ඇත. "*

*"සාමය යනු ගැටුම් නොමැති, මනසේ සන්සුන් භාවයද සහිත පරිසරයකි."*

වසර 26 ක සිවිල් යුද්ධයකින් පසුව ශ්‍රී ලංකාව තුළ "ගැටුම්, යුද්ධය සහ අරගල නොමැති", නිෂේධනීය සාමයක්, ගැටුම් අවසන් වීමත් සමඟ 2009 දී අත්පත් කර ගෙන ඇත. කෙසේ වෙතත්, ගැටුමේ බලපෑම බොහෝ ආකාරවලින් පවතී. පසුගිය වසර 30 ක කාලය තුළ ජීවත්වූ ශ්‍රී ලාංකික තරුණයින් 2009 සිට යුද්ධයෙන් තොර ජීවිතයක් අත්විඳින නමුත් එම ගැටුම් පිලිබඳ මතකය

'ගැටුමෙන් තොර වීම' පිලිබඳ කතා කිරීමේදී ඔවුන්ගේ මනසෙහි තවමත් නැවුම්ව පවතිනවා විය හැක.

<u>එකමුතුව</u>

> *"බහු වාර්ගික සමාජයක එකතුව, සියලු ජාතීන්, ආගම් සහ භාෂාවන්ට ගරු කිරීම මත රඳා පවතී."*

ශ්‍රී ලංකාවේ 26 වසරක ගැටුම වාර්ගික අර්බුදයක් ලෙස විස්තර කෙරේ. යුද්ධයේ බලපෑම සෘජු වියදම තුල පමණක් නොව, තරුණ ආකල්ප සහ අනන්‍යතාවයන් වසර ගණනාවක් හැඩගැස්වීමටද බලපෑවේය. ජාතික තරුණ සමීක්ෂණය 2013 දී තරුණයින්ගේ ජනවාර්ගික අන්‍යන්‍යතාවයන් පිළිබඳ දැඩි දැනුවත් භාවයක් පෙන්වූ අතර, ගැටුමෙන් පසු සියයට 46 ක් පිළිතුරු දුන් ආකාරයට ඔවුන්ගේ ජනවාර්ගික අනන්‍යතාව පිලිබඳ හැංගීම යුද්ධයෙන් පසු වැඩි විය.

> *"සාමය ඇති කිරීම සඳහා සමාජනුයෝජන ක්‍රියාවලිය වැදගත් වේ. විවිධ සංස්කෘතීන් අවබෝධ කර ගැනීම වැදගත් වේ. ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන බාධකයක් වන්නේ වෙනස් සංස්කෘතීන් හා භාෂා පිලිබඳ තේරුම් නොගැනීම යි."*

ශ්‍රී ලංකාව වැනි බහු සංස්කෘතික රටක විවිධ ජාතීන් අතර අනන්‍යතාව අවබෝධය සහ ගෞරවය ඉතා වැදගත් ලෙස තාරුණ්‍ය විසින් හඳුනාගෙන ඇත. සන්නිවේදනය අත්‍යාවශ්‍යය වේ; කෙසේ වෙතත්, රටේ බොහෝ ප්‍රදේශ වලදී භාෂාව තවමත් ගැටළු වලට මුලපුරයි. සෑම ජනවාර්ගික කන්ඩායමක්ම වෙනත් භාෂාවක් කතා කරන අතර තරුණයින්ගෙන් වැඩි දෙනෙක් තවමත් එක් භාෂාවක් පමණක් භාවිත කරයි. භාෂාව සන්නිවේදනය කිරීම, තේරුම් ගැනීම සහ එකිනෙකා සමඟ අන්තර්ක්‍රියාවන් සඳහා උපකරණයකි. කෙසේ වෙතත්, පොදු භාෂාවක් නොමැතිව අන්‍යෝන්‍ය අවබෝධය වඩාත් අපහසු වනු ඇත. ඉංග්‍රීසි භාෂාව 'සබැඳි භාෂාව' ලෙස පිළිගනු ලැබේ. කෙසේ වෙතත් එය නිවැරදිව කතා කරනු ලබන්නේ ජනගහනයෙන් 10% පමණි. එබැවින් විවිධ ජනවාර්ගික කණ්ඩායම් හා සංස්ථා අතර සහභාගීත්වය සහ හවුල්කාරිත්වයට අවස්ථාවන් සීමා වී ඇත.

> *"මම දිවයිනේ විවිධ ප්‍රදේශ වල තරුණ තරුණියන් සමඟ කඳවුරකට සහභාගී වූ අතර, දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල කතා කරන දෙමළ*

*සිසුන් සමඟ දවස් 6 ක් ගත කළෙමි.... ඔවුන් කිව්වා අපේ ජනවාර්ගික කණ්ඩායම වන සිංහල ජනතාව සමග අන්‍යොන්‍ය සම්බන්දතා පවත්වනු ලැබුවේ සොල්දාදුවන් සමග පමණක් බවයි.... ඒ වගේම ඔවුන්ට අපි ගැන වෙනත් අදහසක් තිබුනි.... අපි විවිධ ජනවාර්ගික කන්ඩායම් අතර ජාල හා සන්නිවේදනයන් වැඩි දියුණු කර ගත යුතුයි.*"

<u>යුක්තිය</u>

*"යුක්ති ධර්ම පද්ධතිය, මිනිසුන් අතර ගැටුම් අඩු කරයි. එමෙන්ම 'සාමය' ලෙස හැඳින්විය හැකි තත්ත්වයක් නිර්මාණය කිරීමට උපකාර කරයි."*

*"සාමය යනු සම්පත් සහ ප්‍රතිලාභ සමාන ලෙස බෙදා දීමකි."*

යුක්තිය, සමානාත්මතාව සහ සාධාරණත්වය යනු සමූපදේශනයේදී ශ්‍රී ලාංකික තරුණයින් බොහෝ දෙනෙක් සඳහන් කළ සාමය හා සුරක්ෂිතභාවය පිළිබඳ තවත් පැනිකඩකි. මෙහිදී සාධාරණත්වය යනු ගැටුම් අතරතුරදී සිවිල් වැසියන්ට බරපතල බලපෑමක් ඇති වීම සහ ඒවායෙහි වගකීම් භාර ගැනීම සහ විවිධ ජනවාර්ගික කණ්ඩායම් සහ ස්ත්‍රීන් අතර සමානාත්මතාව සහ සාධාරණත්වය ප්‍රවර්ධයන්ද කිරීම මෙහි ඇතුළත් ය. මෙය සෑම පුද්ගලයෙකුගේම මානව අයිතිවාසිකම් සුරැකීමට උපකාරී වේ. සමාජයේ සාධාරණත්වය නොමැතිව සැබෑ එකමුතුවක් නොමැති බව යෞවන යෞවනියන් ප්‍රකාශ කළේය.

*"අතුරුදහන් වූ පවුල්වලට සිදුවූයේ කුමක් දැයි දැන ගැනීමට උතුරේ ජනතාවගෙන් බොහෝ දෙනෙකුට වුවමනා ය."*

බලහත්කාරයෙන් අතුරුදන්වූවන්ගේ[2] පවුල් තවමත් ආදරය කරන අය පිළිබඳව තොරතුරුක්, යුක්තිය සහ සත්‍ය පිලිබඳ බලාපොරොත්තුවෙන් සිටිති. ඔවුන්ට පිළිතුරක් නොමැතිව සිත අභ්‍යන්තර සාමයක් හෝ සන්සුන් බවක් නැත.

<u>නිදහස</u>

[2] ගැටුම් සමයේ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාව විසින් රඳවාගෙන සිටීමෙන් පසු දහස් ගණනක් පුද්ගලයින් පැහැරගෙන ගොස් හා අතුරුදන් වී තිබේ

*"සාමය පිළිබඳ මූලධර්ම නම් පුද්ගලයන්ට තම අවශ්‍යතාවයන් සපුරා ගැනීම, තමන්ව නිර්වචනය කිරීම හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස භුක්ති විඳීමේ හැකියාව සංරක්ෂණය හා ආරක්ෂා කිරීමයි."*

*"සාමය යනු, භාෂාව, ආගම පදනම් කරගත් ගැටුම්/බෙදීම් නොමැති තත්වයකි. සෑම පුද්ගලයකුටම තමන්ගේ මතය ප්‍රකාශ කිරීමට හා ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව සහ අයිතිය සමානාත්මතාවය නම් වේ. "*

තරුණයින් නිදහස ලෙස හඳුන්වන්නේ ඔවුන් ජීවත්වන ප්‍රජාව තුළ ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ඔවුන්ට හැකියාව හා අවස්ථාව පැවතීමය. සමාජය තුළ නිදහසේ හැසිරීම සඳහා, අධ්‍යාපනය, රැකියා අවස්ථා සහ ප්‍රජාතන්ත්‍රවාදය ද තිබිය යුතු ය. ඔවුන්ගේ හඬ මහජන හඬට ඇසෙන, මහජන හඬෙන් පරාවර්තනය සහ නිරූපණය වන බවට සැකයක් නොතිබිය යුතුය. ජනතාවගේ නිදහස් කැමැත්ත අනුව ප්‍රතිපත්ති සම්පාදනය ඇතුළු විවිධ සමාජ ක්‍රියාවලි වලට සහභාගීවීම උදෙසා මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුය.

## 3. ලංකාවේ සාමයට හා ආරක්ෂාව කෙරෙහි බලපා ඇති අභියෝග හා අවහිරතා

<u>භාෂා බාධකයන්</u>

තරුණ සාම ගොඩනැගීමේ උත්සාහයේ පුළුල් සහ වඩාත් ප්‍රබලතම අවහිරතාව ලෙස භාෂා බාධකය පවතියි. මූලික වශයෙන් සිංහල කථා කරනු ලබන බස්නාහිර හා දකුණු පළාත් වල තරුණයන්, දමිල බස කථා කරන උතුරු හා නැගෙනහිර වෙසෙන තරුණ පිරිස සමඟ සන්නිවේදනය කිරීමේදී දුෂ්කරතාවන්ට පත්වේ. ඉංග්‍රීසි භාෂාව පොදු භාෂාවක් වන්නේය. එහෙත්, ඉංග්‍රීසි භාෂාවෙන් සංවාදයට යෞවනයාගේ ඇති හැකියාව තීරණය වන්නේ පාසල් මට්ටමේ දී ඔවුන් ලබාගත් හැකියාවය මතය. එපමණක් නොව, ජාතික භාෂා ප්‍රතිපත්තිය[3] නිසි ලෙස ක්‍රියාවට නංවා නැති අතර සම්පත් බෙදා හැරීම පාර්ශවීය හා නාමික වේ.

[3] සිංහල භාෂාව සඳහා වැඩි අරමුදල් ප්‍රමාණයක් පවතී. තවද භාෂා දෙකම (සිංහල, දෙමළ) යනු ජාතික භාෂාවන් වේ, ඒවා සැමවිටම භාවිතා නොකෙරේ.

බොහෝ ගම්බද පාසල් අධ්‍යාපන ප්‍රමිතිය පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් නොමැති වීම නිසා පීඩාවට පත්වී සිටී. පන්ති කාමර, ගොඩනැගිලි, පුස්තකාල පහසුකම්, පෙළ පොත්, ආදී වශයෙන් යටිතල පහසුකම් නොමැති වීමද මෙයට ඇතුලත් වන අතර එලෙසම සමහර පාසල් සඳහා මානව සම්පත් ලෙස මුළු පාසලටම සිටින්නේ ගුරුවරු 4-5 ක් පමණි. මෙම තත්වය අභියෝග කරනු ලබන්නේ ගුරුවරයා සතු හැකියාව පමණක් නොවන අතර යම් විෂයක් ඉගැන්වීම සඳහා ගුරුවරයා සතු හැකියාව කෙරෙහීද බලපෑමක් ඇති කරයි.

<u>සමාජ සම්මත හා තහංචි</u>

සංස්කෘතික සම්ප්‍රදායන් තවමත් තරුණ තරුණියන්ට තම මුලපිරීම් හා ප්‍රජා සහභාගීත්වය කෙරෙහි සංවේදී අවදානම් තත්වයන් මතුකරයි. ප්‍රජා නායකත්වය කෙරෙහි යෞවනයන්ගේ දායකත්වය ලබා දීමට අවස්ථාවක් ලබාදීමටත් ප්‍රථම දිගු කාලීන සමාජ සම්මතයන් හා තහංචි විසින් පොදුවේ අවධාරනය කල සමාජ වෙනස්කම් සඳහා ඒකාකෘතික බවට පත් කර ඇත. නිදසුනක් වශයෙන්, ඔවුන්ගේ සන්දර්භය තුළ දැකිය හැකි තරුණ බව පිළිබඳ ජනප්‍රිය සංස්කෘතික යොමු කිරීම දැක්විය හැක. සාමාන්‍යයෙන් මාධ්‍ය තුල තරුණ තරුණියන් ඉතා කම්මැලි, වගකීම් විරහිත පුද්ගලයන් ලෙස හුවා දක්වයි මෙම ලේඛල ඔවුන් මත ඇලවෙන්නේ ඔවුන්ගේ හැකියාවන් ඉදිරිපත් කිරීමට පවා අවස්ථාව නොදීම තුලය.මෙම ව්‍යාකූල සිතුවිලි සංකල්පයන් අනුගමනය කිරීමේ හැකියාව සීමිත බැවින් තරුණයෝ දිගින් දිගටම පහත් කොට සලකුනු ලැබේ. යෞවනයන් තම දුක් ගැනිවිලි නීති සම්පාදකයන් වෙත ඉදිරිපත් කල ද, ඔවුනට අවශ්‍ය පිළිගැනීම නොලැබේ. යෞවන යෞවනියන් අනාගත නායකයින් ලෙස නොපෙනී යන තුරුත්, ඔවුන්ගේ දායකත්වය වර්තමාන නායකයන් ලෙස සලකනු නොලැබුවහොත්, මෙම විෂමතා වටා සමාන්‍ය ජනතාවගේ ආකල්ප වෙනස් කිරීම අභියෝගයක් වනු ඇත. ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමෙන් ශාරීරික, චිත්තවේගාත්මක හා සමාජීය තර්ජනවලට තුඩු දිය හැකි නිසා, ඔවුන්ගේ ආරක්ෂාවද ආරක්ෂා නොවන බැවින් යෞවනය තවමත් සාමය සහ ආරක්ෂාව පිළිබඳ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන තත්වය තුල ඉදිරියට යෑමට අපහසු තත්වයක සිටිති.

<u>අන්ත්වාදී පණිවිඩ</u>

අන්තවාදී කණ්ඩායම් සහ ඔවුන්ගේ පණිවුඩ පැතිරීම පවතින අතර, අවදානම් සහිත යෞවනයන් ඔවුන්ගේ කාරණාව පිළිගනිමින්, වෙනත් භේදකාරී පිරිස්

සමග සන්ධාන නිර්මාණය කිරීම සහ විකල්ප ආකාරයේ මැදිහත්වීම් ගැන සිතීමෙන් සහ හුදෙකලා කිරීම සිදුවේ. ඔවුනට වැදගත් කරුණු අවබෝධ කර ගැනීමට හා අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දීමෙන් තොරව සාමය හා සුරක්ෂිතභාවය පිළිබඳ අදහස තරුණයින්ට ලබා දී ඇත. ආර්ථික සම්පත් සහ සාකච්ඡා අවකාශයන් සීමාසහිත වී හෝ තහනම් කර ඇති බැවින් මෙම සංවාදය තුලට ඔවුන් අවතීර්ණ වීම වැළකී ඇත.
තරුණයින් හා සංවාදය තුළ ඔවුන්ගේ පාර්ශ්වයන් අවබෝධ කර ගැනීම සඳහා ඵලදායී ක්‍රමයන් මැඩපවත්වා ගැනීමට හෝ අසමත් වීමට ඉඩ නොලැබේ. ප්‍රචණ්ඩකාරී කථනය වඩා සාමකාමී සහ උපකාරශීලී දෙයක් වෙත මාරු වීම කෙරෙහි ප්‍රධාන භූමිකාව පුද්ගලික හා රාජ්‍ය මාධ්‍ය විසින් ඉටු කල යුතු වුවද, එවැනි වෙනස් කම් කිරීමට දරන උත්සාහයන් දැඩි ලෙස දේශපාලකයින්ගේ පෞද්ගලික රාමුවලට කොටුවී ඇත. විවිධ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හිඟකම ප්‍රජා කණ්ඩායම් අතර ආතතිය තීව්‍ර කර ඇති අතර සමාජ සමගිය තර්ජනයට ලක්ව ඇත.

<u>කුඩා යෞවන කණ්ඩායම් සඳහා ප්‍රවේශය අඩු වීම</u>

මහා පරිමාණයේ සංවිධාන වෙත ලබා දෙන අරමුදල් අවභාවිතය හෝ වැරදි සහගත ලෙස වෙන්කිරීම සිදු වුවද කුඩා, අලුතින් පිහිටුවන ලද තරුණ සංවිධානවලට අරමුදල් හා සම්පත් එකතු කිරීම අසීරු බව පෙනී යයි. විශාල ව්‍යාපෘති වලට සහභාගී වීමට තරුණ සංවිධානය වලට අවකාශ නොලැබෙන අතර, එමගින් සමාජය තුලට  ඔවුනට අවශ්‍ය පරිදී අනුගත වීමට අවැසි පිළිගැනීම හා වටිනාකම අවතක්සේරු කර ඇති බව පෙනේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස තරුණ ප්‍රජා සහභාගීත්වය බෙදී ඇති අතර තරුණ තරුණියන් එකම හෝ ඊට සමාන ක්‍රියාකාරකම්වල යෙදී සිටින අතර සැලකිය යුතු කොටසක් අසරණ වී ඇත. විශේෂයෙන්ම තරුණ නායකයන් විසින් ආධිපත්‍ය දරනු ලබන රාමුව තුළ නායකත්ව චරිතයන් කරා නැඟී සිටීමින් ඔවුන්ගේ උත්සුකතාවය ප්‍රකාශ කිරීම තරුණ කාන්තා නායකයන්ට අභියෝගයක් බවට පත්ව ඇත.

<u>ප්‍රධාන නගරය සහ ඉන් පිටත කණ්ඩායම් වල ප්‍රවේශය</u>

කොළඹ සහ අනෙකුත් ස්ථාන අතර කේන්ද්‍රීය-ප්‍රයන්ත බෙදීම්, එනම් නාගරික තරුණයන්ට හා අනෙකුත් ප්‍රදේශ වල ගැටළු සහ ප්‍රමුඛතාවයන් අතර කැපී පෙනෙන විසංවාදයක් පෙන්නුම් කරයි. මෙය වෙනස් භාෂා, කුල, ආගම් සහ ජනවර්ග වල ප්‍රතිඵලයක් විය හැකිය. විෂමතාව හඳුනා ගැනීමෙන් තොරව

අසරණ වූ කණ්ඩායම් තීරණ ගැනීමට සහභාගි වීමෙන් වැළකී සිටී. එබැවින් ඔවුන්ගේ උවමනාවන් බොහෝ අවස්ථාවන්හිදී පිලිබිඹු කර ආරක්ෂා කර නැත.

## 4. ශ්‍රී ලංකාවේ සාමය හා ආරක්ෂාව සඳහා පැවතිය යුතු ප්‍රමුඛතා හා නිර්දේශ

උතුරු නැගෙනහිර, දකුණු හා බස්නාහිර යන පළාත් 4 තරුණ තරුණියන් ඔවුන්ගේ නිර්දේශ, ප්‍රජා, ජාතික හා ජාත්‍යන්තර මට්ටම් වලදී ඉදිරි පත්කර ඇත.

ප්‍රජාව:

<u>අන්තර් සංස්කෘතික හුවමාරු හා පුහුණු වැඩසටහන්</u>

තරුණ නායකත්වය හෝ තරුණ ඉලක්කගත වැඩසටහන් සම්පාදනය අන්තර් සංස්කෘතික ප්‍රජාවගේ හුවමාරු කිරීම් ප්‍රවර්ධනය කළ යුතු අතර, පුරවැසියන් ලෙස ඔවුන්ගේ අයිතීන් පිළිබඳ වෙනත් තරුණයන් සහ වැඩිහිටියන් දැනුවත් කිරීම සහ සාමය හා ආරක්ෂාව පිළිබඳ ආකෘතිය හැඩගස්වා ගැනීමට හැකි ය. අයිතිවාසිකම් සහ සිවිල් වගකීම් බෙදාහදා ගැනීමෙන් යෞවන යෞවනියන්ට භූගෝලීය, ජනවාර්ගික හෝ භාෂා වෙනසක් තිබිය හැකි වුවද ඔවුන්ගේ වටිනාකම සහ වටිනාකම වටහා ගැනීමට තරුණයින්ට අවස්ථාව ඇත. දැනුම ඉක්මණින් සම වයස් හා සම අදහස් ඇති පරීක්ෂකයින්ට දැනුම ව්‍යාප්ත කිරීමට ද හැකිය.

ජාතික කතිකාවෙහිදී දුර්වල වන සදාචාරාත්මක හා සදාචාරාත්මක නායකත්වයේ මූලධර්ම වැඩිදියුණු කිරීම සඳහා තරුණ පුහුණු වැඩ සටහන් කළ හැකිය. හොඳ, වගකිව යුතු, සාධාරණ නායකයෙකුට උපකාරයක් වන මූලධර්ම වටහා ගැනීමට තවත් සංවාද අවශ්‍ය වේ. වැඩමුළු හා ක්‍රියාමාර්ග මගින් තරුණ තරුණියන්ට දේශීය, ජාතික හා ජාත්‍යන්තර නායකයින්ගේ නිදසුන් ද, යෞවනයන් මෙහෙයවන ක්‍රියාකාරිත්වය, නිවාස, පාසැල් සහ පොදු ප්‍රවාහන පහසුකම් වැනි දේ පිළිබඳ දැනුවත් බව වැඩිදියුණු කළ හැකි ය.

<u>අනුකම්පාව සහ දයානුකම්පාව</u>

සංවේදනය හා දයානුකම්පාව ගොඩනැංවීම ප්‍රජා මට්ටමෙන් ආරම්භ වේ. එය අනෙක් ක්‍රියාකරුවන්, පිළිවෙළින් තරුණයන් සහ වැඩිහිටියන්ගේ කාර්යභාරය හඳුනා ගැනීමෙන් ආරම්භ වේ. ශ්‍රී ලංකාව සිය ගැඹුරු හා පසුගාමී අතීතයේ සිටම එකිනෙකා සමඟ සැසඳීමත් සමග, එකිනෙකා සමඟ සවන් දීම සහ අනෙක් අයගේ ඉදිරි දර්ශනය ඇසීමෙන් හා ඇගයීමට ඉඩ සලසයි. විවිධ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය, තොරතුරු බෙදාහදා ගැනීම දිරිගැන්වීම සහ සමාජ ඒකාබද්ධතාව වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැලසෙනු ඇත.

<u>සම පදස්ථයන් අතර බෙදීම් හරහා සංවාදය</u>

යෞවන ජාල මගින් දැනුම බෙදාගැනීමේ වේදිකාවන් ගොඩනඟා වෙනත් තරුණ තරුණියන්ට රටේ විවිධත්වය හඳුන්වා දිය හැකිය. භීතියෙන් හෝ වැරදියට ප්‍රතිචාර දැක්වීම වෙනුවට යෞවනයන් ආගමික චාරිත්‍ර, ආහාර පුරුදු, විවිධ භාෂාවලින් ඇති ප්‍රධාන වැකි හුවමාරු කර ගත හැක. ගැටුම් හා ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීම සඳහා අන්‍යොන්‍ය අවබෝධය උපකාරී වේ. තරුණ සවිබල ගැන්වීම සඳහා හවුල් අවස්ථා ද හඳුනා ගත හැකිය.

<u>අන්තර්පරම්පරා  අතර විශ්වාසය ගොඩනැඟීම</u>

ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ පොදු ජනතාවගේ ආකල්ප වෙනස් කිරීම සඳහා පරම්පරාගත සංවාද හා චින්තනය අතිශයින් අවශ්‍යවේ. ශ්‍රී ලාංකික සන්දර්භය තුළ වැඩිහිටියන් සතු බලය සහ අධිකාරිය ඉහළ මට්ටමෙන් පවතින අතර බොහෝ අවස්ථාවලදී ඔවුන්ගේ අනුමත කිරීම හෝ පිළිගැනීම මත ව්‍යාපෘතියක් නතර කිරීම හෝ පැවතීමද තීරණය වේ. වැඩිහිටියන්ගේ වැදගත් කාර්යභාරය තරුණයා විසින් පිළිගන්නා අතර, තරුණයින්ට ක්‍රියා කළ හැකි නව ක්‍රම පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමට ද කැමැත්ත පළ කරයි. යෞවනයන්ගේ වැඩිහිටිත්වය පිළිබඳ වැඩිහිටියන්ගෙන් ඇති වන ප්‍රතිරෝධය බොහෝ විට වයස්ගත වීම සම්බන්ධ දිගුකාලීන සමාජීය සම්මතයන් වේ. තවදුරටත් තරුණ පදනම මත කටයුතු කළ හැකි යෞවනයාගේ කාර්යභාරය පිළිබඳව නිසි අවධානයක් යොමු කළ යුතුය.

සාමකාමිත්වය ගොඩනැඟීමේ උත්සාහයන් ප්‍රවර්ධනය කිරීම සහ ජනගහනයේ අසම්බන්ධිත කොටස්වලට ඒවා වැඩිදියුණු කිරීම සඳහා මෙම වේදිකාවන් භාවිතා කරන ආකාරය ගැන තරුණයින් දැනුවත් කිරීම සහ සමාජ ජාලයන් භාවිතා කළ යුතුය.

ජාතික:

අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන්:

1. හිරිහැර කිරීම්, කොණ්ඩකිරීම, විෂාදය ආදී ගැටලු වලට මුහුණ දෙන්නේ කෙසේද යන්න පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා ගුරු හා උපදේශක සන්වේදන පුහුණු පැවැත්වීම. විදුහපතිවරු, කලාපයේ හා පළාත්වල අධ්‍යාපනික නායකයින්ගේ මග පෙන්වීම ඔස්සේ එහි වගකීම ගුරුවරු වෙත පැවරෙන ලෙස ක්‍රමවේදයක් සකස් කිරීම.

2. පාසල් සහ පංති කාමරවල විවිධත්වය පිළිබඳ සහතික කිරීම - සමවාර්ගික ආගමික කණ්ඩායම්වල වෙසෙන ප්‍රදේශ වල සුළුතර ආගමික කණ්ඩායම් බැහැර කිරීම හෝ සමානව සැලකීම සිදුවේ - නමුත් අඩු සම්පත් පන්ති කාමර පවතී.

3. වරප්‍රසාද සිසුන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීම - මෙමගින් ඔවුන්ට අධ්‍යාපනික පරිසරය තුල විවිධත්වය වෙත ප්‍රවේශය වීමටත්, අනෙකුත් ආගම් හා ජනවර්ග වල සිසුන් හමුවීමට හා එක්ව කටයුතු කිරීමටද අවස්ථාව සැලසේ.

4. ද්වේශ සහගත ප්‍රකාශ වලට විරුද්ධවීම - පක්ෂග්‍රාහී ප්‍රකාශ, විශේෂයෙන්ම අධ්‍යාපන ආයතන වලින් ප්‍රචාරය කරනු ලබන ඉතිහාසය විෂය නිර්දේශ මගින් ඉතිහාස සිද්ධීන් පිළිබඳ ශිෂ්‍යයන්ගේ පූර්ණ අවබෝධට හානියක් සිදුවේ.

5. සියලු විෂයමාලාවලට සාම අධ්‍යාපනය අන්තර්ගත කිරීම - ශ්‍රී ලංකාවේ විවිධ ආගමික සම්ප්‍රදායන් අන් අයට සේවය කරමින් සාමකාමී ජීවිතයක් ගත කළ හැකි ආකාරය පිළිබඳ උගන්වයි. මෙම තේමාව යෞවන යෞවනයන් සමඟම නිරූපණය වන නමුත්, ඔවුන්ගේ හැසිරීම එක්සත්කමට සහ එකට වැඩ කිරීමෙහිලා අත්‍යවශ්‍ය සම්බන්ධකම් ඇති කර ගැනීමට ඔවුන්ට අවස්ථාවක් නොතිබුණි.

<u>අනුරුදන් වූ පවුල්වල තරුණයින් සඳහා වන්දි</u>

අතුරුදහන් වූවන්ගේ කාර්යාලයෙන් ලබාදුන් ඉෂ්ට නොවූ නොවූ පොරොන්දු නිසා අතුරුදන් වූවන්ගේ පවුල්වල තරුණයින් හා පවුල් වල අය බරපතල ලෙස පීඩාවට පත්ව සිටී. එමනිසා, අතුරුදන් වූවන්ගේ පවුල්වල තරුණයින් සඳහා විශේෂයෙන් වන්දි ගෙවීමක් සිදු කළ යුතු ය. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ යෞවනයන් විශේෂයෙන් සැලකිල්ලට ගත් අතර වන්දි හා අතුරුදන් කිරීම් පිළිබඳ තත්වය මත ආන්ඩුව වෙතින් ප්‍රතිචාර ලබා ගැනීම සඳහා වීදි බැසීමට කටයුතු කර ඇත. විශේෂයෙන්ම යෞවනයන්ට මේ හේතුව නිසා ඔවුන් ආදරය කරන අය අහිමි වූ නිසා ඔවුන්ගේ පවුල්වලට අස්ථාවර තත්ත්වයන් ඇති කර තිබේ.

<u>නීරණ ගැනීම කෙරෙහි ප්‍රවේශ වීම හා දැනුවත් වීම</u>

**ව්‍යවස්ථාදායක ක්‍රියාවලීන්, පනත් කෙටුම් පත් සහ ක්‍රියාවන් බොහෝ විට** තරුණ ජීවිතයට බලපාන නව **ප්‍රතිසංස්කරණ** ක්‍රියාවට නංවනු ලබයි. ජාතික තරුණ සේවා සභාව සහ තරුණ පාර්ලිමේන්තු සභාවට පිටින් ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දීම සඳහා තරුණයන්ට අවස්ථාව ලබාදීම මගින් ඔවුන්ගේ ඉදිරි දර්ශනයන් අර්ථවත් ආකාරවලින් නියෝජනය වන පරිදි, ඒවාට දායක වන **ප්‍රතිපත්ති** සම්පාදනය කිරීමට දායක වීමට හැකියාව ලැබේ. පළාත්, පළාත් හා ජාතික මැතිවරණ නිරීක්ෂණ, දූෂණය හා අපරාධ නිරීක්ෂනය කිරීම මගින් ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවල ඔවුන්ගේ කාර්යභාරය වැඩිදියුණු කළ හැකිය. මෙම අවකාශයට හඳුන්වා දීම, දේශපාලන වාතාවරණය, එහි ලීවරයන් සහ ඒවායේ දෘඩ **ව්‍යුහයන්ට** හොඳම ලෙස හැඩගැසීමට ඔවුන්ට උපකාර කරනු ඇත. තෝරා පත්කරනු ලබන සහ සිවිල් රාජ්‍ය සේවකයින් සඳහා ස්ත්‍රී පුරුෂ බව හා සාමය ගොඩනැගීම පිළිබඳ **අවශ්‍ය** සංවේදී පුහුණුව ලබා දිය යුතුය. තරුණ කණ්ඩායම් සහ තමන් අතර මිත්‍රශීලී සබඳතාවන්ට උදව් කිරීම සඳහා මෙම තරුණයින් ගෙන එනු ලබන සහ ගොඩනංවන වටිනා එකතු කිරීම් අවබෝධ කර ගැනීමට ඔවුන්ට උපකාර කරනු ඇත.

<u>රැකියා හා අන්තර් සම්බන්ධිත දක්ෂතා ගොඩ නැගීම</u>

යෞවන යෞවනියන් සඳහා ජාතික වැඩසටහන් දියත් කළ යුතු අතර ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ආධාර කිරීම. තරුණයින්ට ඔවුන්ගේ කාර්යභාරය වඩාත්ම ප්‍රයෝජනවත් වන ආකාරය

පිළිබඳ වැඩිදුර සාකච්ඡා සමඟින්, සාමය හා ආරක්ෂාව පිළිබඳ ගැටළු ඖෂධ, විරැකියාව, නිපුණතා සංවර්ධනය නොමැති වීම වැනි ගැටළු සම්බන්ධව දැනුවත් කිරීම සඳහා නව පියවර ගත හැකිය.

<u>සාර්ථක දේශීය ව්‍යාපෘති ආරම්භ කිරීම</u>

සාර්ථක සාම සාධක ව්‍යාපෘති ප්‍රසාරණය කිරීම - අරමුදල් සහ බලපෑම යන දෙඅංශයෙන්ම, විශේෂයෙන්ම අන්තර්වාර ආගමික නායකයන් විය යුතු අතර, ප්‍රාදේශීය මට්ටමේ සිට දේශීය මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් සංක්‍රමණය වීමෙන් ප්‍රාථමික ශක්තියෙන් පැමිණිය යුතුය.

අන්තර්ජාතික:

<u>තරුණ කණ්ඩායම් සහ තහවුරු කිරීමේ දත්තවලට පිවිසීම</u>

විධිමත් දේශනවලට හා රැස්වීම්වලට වඩා තරුණයන්ට වඩා ශක්තිමත් ලෙස කතා කරන ප්‍රයත්නයන් සඳහා ජාත්‍යන්තර ආයතන සහයෝගය ලබාදිය යුතුය. ප්‍රජාව ගොඩනැඟීමේ මෙවලම් ලෙස ශක්තිමත් මාධ්‍ය මෙවලම් මගින් තරුණ ප්‍රේක්ෂකයින් වෙත ප්‍රබල ලෙස ජනනය කළ හැකිය.

තරුණ සංවිධාන සතු සාමය ගොඩනැගීමේ අදහස් හා අරමුදල් ලබාදීම සඳහා ඒවා හඳුනා ගැනීම සහ ගැටළු හඳුනා ගැනීම සඳහා ගැටුම් ඇති ප්‍රදේශවල පර්යේෂණ සිදු කිරීම සඳහා ජාතික ප්‍රවීණයන් සමඟ හවුල් වීමට ජාත්‍යන්තර සංවිධාන දිරිමත් කළ යුතුය.

<u>ජාත්‍යන්තර සාමය ගොඩන පිරිස් සහ ආගමික පූජකවරු සමඟ වැඩ කිරීම</u>

ආගමික නායකයන් හා තරුණයන් අතර විශ්වාසය ගොඩනැඟිය යුතු අතර, තවත් බෙදීමක් ඇතිකිරීමට වඩා වෙනස් විශ්වාසයන් ඇති පුද්ගලයන් එකිනෙකට වෙනස් වන පණිවුඩ බෙදා හදා ගැනීමට ඔවුන් දිරිමත් කළ යුතුය.

<u>බාධක හරහා සන්නිවේදනය කිරීම සහ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය සහතික කිරීම</u>

තරුණ ප්‍රජාව සමඟ සම්බන්ධතා ඇති **රාජ්‍ය** නොවන සංවිධාන අතර සම්බන්ධීකරනය, සහයෝගිතාව සහ අදහස් හුවමාරු කර ගැනීම සඳහා අඛණ්ඩව පහසුකම් සැපයිය යුතුය. එමගින් ප්‍රතිපත්තිමය සාකච්ඡාවලදී තරුණ ප්‍රජාව කෙරෙහි ඇති අවධානය නැති වීම හෝ අතපසු වීම සිදු නොවේ.